## 1.1 තත්ත්වාගණනය කළ මතය

විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආරෝග්‍යශාලා මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආරෝග්‍යශාලා මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආරෝග්‍යශාලා මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආරෝග්‍යශාලා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආරෝග්‍යශාලා මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආරෝග්‍යශාලා මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආරෝග්‍යශාලා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබාගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආරෝග්‍යශාලා මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම්කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලිද ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආරෝග්‍යශාලා මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආරෝග්‍යශාලා මණ්ඩලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතුකර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතාකර ඇති බව,

**1.5** මූල්‍ය ප්‍රකාශන

--------------

**1.5.1** ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

------------------------------------------------------------

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 හි 47 ඡේදය ප්‍රකාරව, ප්‍රමාණාත්මක පූර්ව කාලපරිච්ඡේද වැරදි ඒවා සොයා ගැනීමෙන් පසුව නිකුත් කිරීම සඳහා අනුමත කරන පළමු මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි වරද සිදු වූ කාලපරිච්ඡේදය සඳහා ඉදිරිපත්කර ඇති සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීමෙන් අතීතානුයෝගීව නිවැරදි කළ යුතු වුවද, එසේ නොකර පෙර වර්ෂ ගැලපීම් ලෙස රු. මිලියන 2.75 ක් 2019 ජනවාරි 01 දිනට ඉදිරියට ගෙන ආ සමුච්චිත ඌනතාවයට ගලපා තිබුණි. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මෙම වරද නිවැරදි කරන බව. | ප්‍රමිතය ප්‍රකාරව කටයුතු කරමින් මෙම වැරදි නිවැරදි කර 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 21 ඡේදය ප්‍රකාරව, ගොඩනැගිලි හා දේපළ පවත්වාගෙන යාමේදී දරනු ලබන අලුත්වැඩියා හා නඩත්තු වියදම් පුනරාවර්තන වියදම් ලෙස ආදායමට ලියා හැරිය යුතු වුවද ගොඩනැගිලි අලුත්වැඩියා සඳහා වැයකර තිබුණු පුනරාවර්තන ස්වරූපයේ වියදම් රු.මිලියන 7.11 ක් | ගොඩනැගිලි අළුත්වැඩියා සඳහා කර ඇති ඇතැම් වියදම් මූලධන ප්‍රතිපාදන යටතේ ඇස්තමේන්තුගතකර ප්‍රතිපාදන ලබා ගෙන ඇති බැවින්ද, වියදම හේතුවෙන් වත්කමේ පිරිවැය වැඩි වීම, එහි කල් පැවැත්ම වසර 3 ත් 5 ත් | -එම- |

| | | | |
|---|---|---|---|
| | ප්‍රාග්ධනිත කිරීම නිසා වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | ඉක්මවා යාම වැනි හේතු මත මූලධන වියදම් ලෙස හඳුනාගත් බව. | |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 43 ඡේදය ප්‍රකාරව, පිළිගත් හා අදාළ වෘත්තීය සුදුසුකම් ඇති තක්සේරුකරුවෙකු වත්කම්වල අගය තක්සේරු කිරීම සඳහා යොදා ගත යුතු වුවත්, පිළිගත් වෘත්තිය සුදුසුකම් නොමැති තක්සේරුකරුවෙකු විසින් තක්සේරුකර තිබුණු වාහන 5 ක වටිනාකම රු.මිලියන 32.60 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එම නිසා තක්සේරු වටිනාකම විගණනයේදී පිළිගත නොහැකි විය. | ප්‍රමිතය ප්‍රකාරව වෘත්තීය සුදුසුකම් ඇති තක්සේරුකරුවෙකු ලවා වත්කම් තක්සේරු කර 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන නිවැරදි කරන බව | -එම- |
| (ඈ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.මිලියන 134.38 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වී තිබුණු ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතුකර නොතිබුණි. තවද තාවකාලිකව අක්‍රිය වී ඇති, ක්‍රියාකාරී භාවිතයෙන් විශ්‍රාම ගන්වා ඇති හා බැහැර කිරීමට ඇති දේපළ, පිරියත හා උපකරණ හඳුනා ගැනීමට හා සාධාරණ අගය හෙළිදරව් කිරීමටද කටයුතු කර නොතිබුණි. | ප්‍රමිතය ප්‍රකාරව, සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම් පිළිබඳ වාර්තාවක් පිළියෙල කර ඒවා ප්‍රත්‍යාගණනය කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරී (භාණ්ඩ සමීක්ෂණ) වෙත යොමු කළ බව හා ඒ පිළිබඳ කටයුතු කිරීම සඳහා නිලධාරීන් වෙන්කර ඇති බව සෞඛ්‍ය අමාත්‍යංශයෙන් දැනුම් දුන් බව. | ප්‍රමිතය ප්‍රකාරව කටයුතු කරමින් මෙම වැරදි නිවැරදි කර 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළදී සෞඛ්‍ය අමාත්‍යංශය වෙතින් පරිත්‍යාගයක් ලෙස ලැබී තිබුණු පිරිවැය රු.මිලියන 8.5 ක් වූ ගිලන් රථයේ වටිනාකම පරිත්‍යාග ලෙස මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කරනු වෙනුවට ප්‍රත්‍යාගණන සංචිත ගිණුමට ඇතුළත් කර තිබුණි. | මෙම වරද නිවැරදි කර 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන බව. | මෙම වරද නිවැරදි කර 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | **2010** වර්ෂයේ සිට පරිත්‍යාග ලෙස ලැබී තිබුණු මුළු පිරිවැය රු.මිලියන **14.38** ක් වූ ස්ථාවර වත්කම්වල ඉකුත් වර්ෂ **9** හි හා සමාලෝචිත වර්ෂයෙහි ක්‍රමක්ෂය වටිනාකම රු. මිලියන **8.25** ක් වුවද අදාළ ක්‍රමක්ෂය ගැලපීම් මූල්‍ය ප්‍රකාශනවල සිදුකර නොතිබුණු අතර, වෙනත් ප්‍රාග්ධන ප්‍රදානයන්ට අදාළ සමාලෝචිත වර්ෂයේ ක්‍රමක්ෂය රු.**5,858,840** ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ගලපා තිබුණි. එම නිසා වත්කම්වල අගය හා සංචිත වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | -එම- | -එම- |
| (ඇ) | **2019** දෙසැම්බර් **31** දිනට පැවති ශල්‍ය උපකරණ **02** ක පිරිවැය රු.මිලියන **1.4** කින් හා යන්ත්‍රෝපකරණ හා ලී බඩු සවි කිරීම් අයිතම **08** ක පිරිවැය රු.**287,188** කින් වැඩියෙන් ගිණුම්ගත කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | -එම- | -එම- |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ) 1999 අංක 38 දරන විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලය පනත** | | | |
| **(i) 3.1 උප වගන්තියේ (iii) ඡේදය** | විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලාවේ සේවයේ නියුතු වෛද්‍ය වෘත්තිකයින් විසින් ඔවුන් අතරින් තෝරා පත්කරගනු ලබන තැනැත්තෙක් ආරෝග්‍යශාලා මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස පත්කර නොතිබුණි. | වෛද්‍ය කාර්ය මණ්ඩලයේ සියළු දෙනාගේ එකඟවීම මත රෝහල් අධ්‍යක්ෂක, මෙම මණ්ඩලයේ අධ්‍යක්ෂ ලෙස පත් කිරීමට සෞඛ්‍ය අමාත්‍යංශය වෙත යොමු කළද අමාත්‍යංශයෙන් මෙම පත්වීම ලබා දී නොමැති බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | **(ii) 3(3)** හා **3(4)** උපවගන්ති | ආරෝග්‍යශාලා මණ්ඩලයේ වැඩබලන සභාපතිවරයා අදාළ අමාත්‍යවරයා විසින් පත් කළ යුතු වුවත්, ඒ වෙනුවට අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා ස්ථිරත්වයෙන් වැඩබලන සභාපතිවරයෙකු පත් කර තිබුණි. **2018** අගෝස්තු **20** දින සිට **2020** ජනවාරි **29** දින දක්වාම විධිමත් පත්වීමකින් තොරව වැඩ බලන සභාපති ලෙස කටයුතු කර තිබුණි. | මේ වන විට විධිමත් ලෙස සභාපතිවරයෙකු පත්කර ඇති බව. | විධිමත් නොවන පත්වීමක් සිදුකර ලබාදී ඇති වරප්‍රසාදවලට අදාළ මූල්‍ය වටිනාකම වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගත යුතුය. |
| | (iii) **5.1** උපවගන්තිය | ආරෝග්‍යශාලා මණ්ඩලයේ රැස්වීම් මාසයකට එක් වරක් හෝ පැවැත්විය යුතු වුවද, **2019** වර්ෂය තුළ රැස්වීම් **5** ක් පමණක් පවත්වා තිබුණි. | රැස්වීම පැවැත්වීමට දින නියම කිරීම සභාපතිතුමියගේ බලතල මත සිදු වන බව හා **2021** වර්ෂයේදීද මාසික රැස්වීම් පැවැත්වීමේ අවශ්‍යතාව පිළිබඳව එතුමිය දැනුවත්කර ඇති බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (iv) **7** වගන්තිය | ආරෝග්‍යශාලා මණ්ඩල පනතේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති සීදුවේ පිහිටි ඉඩමේ අයිතිය **2020** අගෝස්තු **31** දින වන විටත් ආරෝග්‍යශාලා මණ්ඩලය වෙත පවරා ගැනීමට කටයුතුකර නොතිබුණි | විජය කුමාරතුංග පදනමට හැර සිලෝන් ඇග්‍රෝ ආයතනයට අයත් ඉඩමක්ද පවතින බැවින් සිලෝන් ඇග්‍රෝ ආයතනයෙන් විමසීම් කර මුල් ඉඩමේ පිඹුරුපත් මණ්ඩලයෙන් ලබා ගැනීමෙන් අනතුරුව තනි පිඹුරුපතක් සෑදීමට ඉදිරියේදී කටයුතු කරන බව. | පනතේ නිශ්චිතව දක්වා ඇති ඉඩමේ අයිතිය ආරෝග්‍යශාලා මණ්ඩලය වෙත පවරා ගැනීම කඩිනමින් කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි **225(1), 245(1)** හා **257** | සියළු ගෙවීම් සඳහා නියමිත ආකෘති පත්‍ර නිවැරදි ලෙසත් සම්පූර්ණ ලෙසත් පුරවා පිළියෙළ කරන ලද වවුචර් සහතික කරන නිලධාරියා විසින් සහතික කර ගෙවීම් කළ යුතු අතර සහතික නොකරන ලද වවුචරයන්ට මුදල් ගෙවීම බල රහිත | මේ වන විට සේවයෙන් ඉවත්කර ඇති ගණකාධිකාරී විසින්, සහතික නොකළ වවුචර් සඳහා ගෙවීම් සිදුකර ඇති බව හා ඉදිරියේදී මෙවැනි දෝෂ සිදු වීම වැළැක්වීමට කටයුතු කරන බව. | සහතික නොකරන ලද වවුචර් සඳහා ගෙවීම් කරන ලද නිලධාරීන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ගෙවීමක් සේ සැළකිය යුතුය. නමුත් සමාලෝචිත වර්ෂය තුළදී සහතික නොකළ ගෙවීම් වවුචර් 138 ක් සඳහා ගෙවා තිබුණු මුළු මුදල රු.මිලියන 19.27 ක් විය. මුදල් රෙගුලාසි 257 ප්‍රකාරව ඒ පිළිබඳ වගකිව යුතු නිලධාරීන්ගෙන් එම මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ඇ) | 1998 දෙසැම්බර් 30 දිනැති අංක 29/98 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1.1 හෝ 3.2.1 හා 3.1.3 හෝ 3.1.4 ඡේද | චක්‍රලේඛයේ 3.1.1 ඡේදයේ හෝ 3.2.1 ඡේදයේ සඳහන් සුදුසුකම් සහ එම සුදුසුකම්වලට අමතරව 3.1.3 ඡේදයේ හෝ 3.1.4 ඡේදයේ සඳහන් සුදුසුකම් සපුරා නොතිබියදී නිලධාරීන් 23 දෙනෙකු වෙත 2019 ජනවාරි සිට 2020 මාර්තු මාසය දක්වා කාලයට අදාළව භාෂා දීමනා වශයෙන් ගෙවා තිබුණු සම්පූර්ණ මුදල රු.343,792 ක් විය. | නිලධාරීන් 23 දෙනෙකුට ගෙවන ලද භාෂා දීමනාව 2020 ජූලි මස සිට අත්හිටුවන ලද බව, චක්‍රලේඛන විෂමතා මත එම දීමනා ගෙවීම සිදුව ඇති බැවින් එය නිවැරදි කිරීම සඳහා නව සෞඛ්‍ය ලේකම් විසින් නිර්දේශිත වාර්තාවක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්කර ඇති බව. | දීමනා ලාභීන්ගෙන් හෝ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව නියමිත සුදුසුකම් සපුරා නොතිබුණු නිලධාරීන්ට දීමනා ගෙවීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ගෙන් හෝ චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව ගෙවන ලද මුදල් ආපසු අය කර ගත යුතුය. |
| (ඈ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 9.3.1 ඡේදය | අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු සඳහා බඳවා ගැනීමේ හා උසස්කිරීමේ පටිපාටි පිළියෙල කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු වුවත් මෙම වාර්තාවේ දිනය වන විටත් බඳවා ගැනීමේ පටිපාටි පිළියෙල කර අනුමත කර ගෙන නොතිබුණි. | බඳවා ගැනීමේ පටිපාටි පිළියෙල කිරීමට කටයුතු යොදා ඇති බව. | අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු සඳහා බඳවා ගැනීමේ හා උසස්කිරීමේ පටිපාටි පිළියෙල කර අනුමතකර ගැනීමට කඩිනමින් ක්‍රියා කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | **2010 දෙසැම්බර් 14 දිනැති අංක 55 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය.** | අවම වශයෙන් මාස 3 කට වරක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවද, 2019 වර්ෂය සඳහා විගණන කමිටු රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි. | ඉදිරියේදී නියමිත පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඊ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (අ) සහ (ආ ) මාර්ගෝපදේශ | සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | දැනට වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පමණක් පිළියෙළ කරන බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ ප්‍රකාරව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙළ කළ යුතු අතර අවශ්‍යතාවය පරිදි එය වාර්ෂිකව යාවත්කාලීන කළ යුතුය |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 63.51 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.මිලියන 45.73 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 109.24 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට, රාජ්‍ය ප්‍රදාන රු.මිලියන 28.42 කින් අඩුවීම හා වර්ෂයේ වියදම් රු.මිලියන 83.38 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වාට්ටු සංකීර්ණ ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු.මිලියන 256 ක ප්‍රතිපාදන වෙන් කර 2019 දෙසැම්බර් 31 දින වන විට ඉදිකිරීම් නිම කිරීමට සැලසුම්කර තිබුණද, එදින වන විට කොන්ත්‍රාත්තුව පිරිනැමීම පමණක් සිදුකර තිබුණි. | සෞඛ්‍ය අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් සියළු ප්‍රසම්පාදන කටයුතු අවසන් කර කැබිනට් ප්‍රසම්පාදන කමිටුවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව පත් වූ නව රජය ඉදිරි වර්ෂ 2 ක කාලය සඳහා සියළුම ව්‍යාපෘතීන් හා නව ඉදි කිරීම් අත්හිටුවන ලද බැවින් මෙම ව්‍යාපෘතියද නැවතී ඇති බව හා මෙම ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධ සම්පූර්ණ වගකීම සෞඛ්‍ය අමාත්‍යාංශය සතු වන බව. | වෙන්කර ඇති ප්‍රතිපාදනවලින් උපරිම ප්‍රයෝජන ගැනීමට හා සැලසුම්කළ පරිදි ඉදිකිරීම් නිම කරවා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයට පෙර රු.**136,859** කට මිලදී ගෙන තිබුණු ද්‍රව්‍ය වර්ග ඒකක **208** කින් හා සමාලෝචිත වර්ෂයේදී රු.**426,071** කට මිලදී ගෙන තිබුණු ද්‍රව්‍ය වර්ග ඒකක **25,092** කින් ඒකකයක් හෝ සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් පරිභෝජනයට ගෙන නොතිබුණි. | වෛද්‍යවරුන් මාරුවී යාම හා ඊට සමාන්තරව ප්‍රතිකාර ක්‍රම වෙනස් කර විකල්ප ඖෂධ භාවිතයට ගැනීම, අපේක්ෂිත අයුරින් රෝගීන්ගේ නොපැමිණීම හා ඇතැම් ඖෂධ සෙමෙන් භාවිතවීම ඖෂධ තොග පරිභෝජනයට නොගෙන තිබීමට හේතු වන බව. | කල් ඉකුත්වීමට පෙර වෛද්‍ය සැපයුම් ද්‍රව්‍ය පරිභෝජනයට ගැනීම පිළිබඳව අවධානය යොමු කළ යුතුය. |

**3.2** මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී දන්ත ප්‍රතිකාර අංශයෙහි ප්‍රතිකාර ලබා ගත් රෝගීන්ගේ අඩුවීම සියයට **23.6** ක් විය. එසේම වාට්ටු අංක **1** හා වාට්ටු අංක **2** හි ප්‍රතිකාර ලත් රෝගීන්ගේ අඩුවීම ඉකුත් වර්ෂයට සාපේක්ෂව පිළිවෙළින් සියයට **24** ක් හා සියයට **31** ක් විය. තවද ලේසර් ප්‍රතිකාරයන්හි අඩුවීම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට **40** ක් විය. | රෝහලකට රෝගීන් පැමිණීමේ ප්‍රවණතාව රෝගීන්ගේ අවශ්‍යතාව මත රඳා පවතින බව. රෝහලට පැමිණෙන රෝගීන් සඳහා සත්කාර සේවාව සිදු කරන අතර රෝගීන් සංඛ්‍යාව අඩු වීම රෝග නිවාරණ කටයුත්තේ සාර්ථකත්වයක් ලෙස සැලකිය හැකි බව. | රෝග නිවාරණ කටයුත්තේ සාර්ථකත්වය රෝගීන් සංඛ්‍යාව වැඩි ප්‍රවණතාවයකින් යුතුව අඩු වීමට හේතුවී ඇති බව තහවුරු කළ යුතුය. රෝගී සත්කාර සේවය ඉහල නැංවීම තුළින් වැඩි රෝගීන් පිරිසකට සේවය සැලසීමට රෝහල් කළමනාකාරීත්වයේ අවධානය යොමු කළ යුතුය. |

**3.3** ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළදී ආරෝග්‍යශාලා මණ්ඩලයේ පිරිසිදු කිරීමේ සේවාව සපයා ගැනීම සඳහා වූ ප්‍රසම්පාදනයේදී, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ **2.11.3** හා **4.3.1** මාර්ගෝපදේශයන් අනුගමනය කර නොතිබුණි. එසේම **7.9.11** මාර්ගෝපදේශය ප්‍රකාරව, අඩු මිල ගණන් යටතේ කාර්යය ඉටුකරන ආකාරය පිළිබඳව ලංසුකරුවන්ගෙන් පැහැදිළි කිරීම් ලබා ගෙන නොතිබුණි. | රසායන ද්‍රව්‍යවල ප්‍රමිතිය පිළිබඳ වඩාත් සැළකිලිමත් වීමට ඉදිරි ප්‍රසම්පාදනවලදී කටයුතු කරන බව.<br><br>ලංසුකරුවන් තෝරා ගැනීම රෝහලට ආර්ථික වශයෙන් ලාභදායී වන අයුරින් සිදුකර ඇති බව, සියළුම සේවකයන් හා වැඩ පරීක්ෂකවරුන් සේවයට පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා අත්සන් ලේඛනයක් මාසිකව පවත්වා ඇති බව, එම ලේඛනය දෛනිකව පරිපාලන නිලධාරී හෝ වෙනත් නිලධාරියෙකු විසින්ද රාත්‍රී කාර්යභාර හෙද නිලධාරී විසින්ද පරීක්ෂාකර බලා අත්සන් කරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල දක්වා ඇති ආකෘතිය ප්‍රකාරව ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තා පිළියෙල කළ යුතුය.<br><br>ලංසු ලේඛනවල පොදු කොන්දේසි ප්‍රකාරව, විෂබීජනාශක ද්‍රව්‍ය නියමිත ප්‍රමිතියෙන් යුතුව පවතින්නේද යන්න හා මිල ගණන් වෙළඳපල මිල ගණන් හා සැසඳීමේදී සාධාරණද හා තාත්ත්විකද යන්න ලංසු ඇගයීමේදී සළකා බැලිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පිරිසිදු කිරීමේ කාර්යයෙහි නිරත වැඩ පරීක්ෂකවරුන් හා සේවකයන්ගේ පැමිණීමේ හා පිටවීමේ වාර්තා රෝහලේ වගකිව යුතු නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ පවත්වා නොතිබුණි. භාවිත කරන ලද රසායන ද්‍රව්‍යයන්හි ප්‍රමිතිය පිළිබඳ සහතිකයකින් තොරව කොන්ත්‍රාත්කරු වෙත සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණු මුළු මුදල රු.මිලියන 9.22 ක් විය. පිරිසිදු කිරීමේ සේවා ගිවිසුමට පටහැනිව පැය 24 ට වඩා සේවකයන් සේවයේ යෙදවූ අවස්ථා 38 ක්ද අඩුවෙන් සේවකයන් යොදවා තිබුණු අවස්ථා 154 ක්ද විය. | පැය 24 ට වඩා වැඩියෙන් සේවයේ යෙදවූ අවස්ථාවලදී හා අඩුවෙන් සේවකයන් යෙදවූ අවස්ථාවලදී ගිවිසුම් ප්‍රකාරව මාසික බිල්පත්වලින් එම ගාස්තු අඩුකර ඇති බව. | සියළුම ලංසුකරුවන්ගේ මිල ගණන් පිළිබඳ විස්තරාත්මක ඇගයීමක් සිදු කර සාරාණුකූලව ප්‍රතිචාර දක්වන අවම ලංසුව තෝරාගත යුතුය.<br>ලංසු ඇගයීමේ තීරණාත්මක සාධකයන් කෙරෙහි තාක්ෂණික ඇගයීම් කමිටුවේ අවධානය යොමු කළ යුතුය.<br>පිරිසිදු කිරීමේ සේවයේ වැඩ පරීක්ෂකවරුන්ගේ හා සේවකයන්ගේ පැමිණීමේ හා පිටවීමේ වාර්තා දෛනිකව පරීක්ෂාකර නිවැරදි බවට අත්සන් තැබීම වගකිව යුතු නිලධාරියෙකු වෙත පැවරිය යුතුය.<br>පිරිසිදු කිරීමේ කොන්ත්‍රාත් ගිවිසුමෙහි ඇතුළත් වගන්ති ප්‍රකාරව කොන්ත්‍රාත්කරු කටයුතු කරන්නේද යන්න නිරන්තර පරීක්ෂාවට ලක් කළ යුතුය. |
| (ආ) | ආරෝග්‍යශාලා මණ්ඩලයේ ඉදිරිපස මාර්ගය තාර දැමීමේ හා බාහිර රෝගී අංශයේ කාමරබෙදා වෙන් කිරීමේ කාර්යයන් දෙක සඳහා විවෘත තරඟකාරී ක්‍රමය යටතේ තෝරා ගෙන තිබුණු කොන්ත්‍රාත්කරුවන් වෙත කොන්ත්‍රාත් වටිනාකම පිළිවෙලින් රු.මිලියන 3.26 කට හා රු.මිලියන 1.53 කට පිරිනමා තිබුණි. එම කොන්ත්‍රාත් පිරිනැමීමේදී වෙනස්කම් පවතින ලංසු මිල ගණන් නොසළකා හැර ඇගයීම් කටයුතු සිදු කරන ලෙස රෝහල් අධ්‍යක්ෂ විසින් උපදේශකවරයා වෙත දන්වා තිබීම හේතුවෙන් උපදේශක ආයතනය විසින් අවම මිල ගණන් ඉදිරිපත් කළ ආයතන | ප්‍රසම්පාදන කමිටුවේ සභාපති රෝහල් අධ්‍යක්ෂ බැවින් රෝහල් අධ්‍යක්ෂකගේ තීරණය අවසන් තීරණය ලෙස සලකා කටයුතු කර ඇති බව. | සියළුම කොන්ත්‍රාත් සම්බන්ධයෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය. එසේ කටයුතු නොකිරීමෙන් සිදු වූ පාඩුව ඊට වගකිව යුතු නිලධාරීන්ගෙන් අය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නොසළකා හැර ඇගයීම සිදු කර තිබීම හේතුවෙන් කොන්ත්‍රාත් දෙකෙන් රු.**476,849** ක පාඩුවක් සිදු වී තිබුණි. | | |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන **2.93** ක් වැය කර ශල්‍යාගාරය සඳහා නිර්වින්දන යන්ත්‍රයක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයේදී, යන්ත්‍රය පිරිවිතර සහ වෙනත් එකඟ වූ නියමයන්ට අනුකූල බව, ලංසු කොන්දේසිවලට අනුකූලව යන්ත්‍රය ලැබී ඇති බව, සපයනු ලැබූ යන්ත්‍රය ස්ථානගත කිරීම හා සවි කිරීම් නිසි පරිදි සිදු කළ බව, අමතර උපාංග ලැබී ඇති බව, යන්ත්‍රයේ වගකීම් සහතිකය හා අත්පොත ලැබී ඇති බව, විශේෂ පුහුණුව හා භාවිත කිරීමට අවශ්‍ය උපදෙස් විස්තර කිරීම් ආදිය යන්ත්‍රය භාවිතා කරන නිලධාරියාට (End User) ලබා දුන් බව, ස්ථානගත කිරීමෙන් පසුව යන්ත්‍රය නියමිත ආකාරයෙන් ක්‍රියා කරන බවට තහවුරු කිරීම හා අවශ්‍ය කැටලොග්, මැනුවල්, උපදෙස් හා මඟපෙන්වීම් ආදිය ලබා දුන් බව ජීව වෛද්‍ය ඉංජිනේරුවරයකු විසින් සහතික කර නොතිබුණි. | මෙය හොඳ තත්තවයෙන් ක්‍රියාත්මක වන බවටත් ඉල්ලා ඇති පිරිවිතර වලට අනුකූලව සපයා ඇති බවටත් විශේෂඥ ශල්‍ය වෛද්‍යවරයා විසින් ඉන්වොයිස් පත්‍රයේ අත්සන් තබා ඇති බව, යන්ත්‍රයේ වගකීම් සහතිකය තහවුරු කරන ලියවිල්ල රෝහල වෙත ලබා දී ඇති බව හා කැටලොග්, මැනුවල් ශල්‍යාගාරය භාර හෙද නිලධාරිනිය වෙත භාර දී ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව යන්ත්‍රයේ අවසන් භාවිත කරන්නා හෝ ජීව වෛද්‍ය ඉංජිනේරුවරයෙකු වෙතින් සියළු කරුණු ඇතුළත්ව අදාළ සහතිකය ලබා ගත යුතුය. |

**3.4** මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අනුමත කාර්ය මණ්ඩලයට අයත් නොවන තනතුරක් වූ ළමා රෝග විශේෂඥ **(Consultant Pediatrician)** තනතුර සඳහා පැමිණීමේ පදනම මත **(Visiting Basis)** පසුගිය වර්ෂ **4** ක කාලය තුළ සේවය ලබා ගෙන තිබුණි. එසේ වුවද ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ මෙම සායනය සඳහා සහභාගී වූ රෝගීන් සංඛ්‍යාවෙහි සියයට **41** ක අඩුවක් නිරීක්ෂණය විය. | රෝගී සත්කාර අවශ්‍යතාව මත මෙම වෛද්‍යවරයා පැමිණෙන නමුත් රෝගීන්ගේ පැමිණීම අඩු වැඩි වීම රෝහල් පාලනයෙන් බැහැරව සිදුවන ක්‍රියාවලියක් බව. | ඉකුත් වර්ෂ **4** තුළ රෝගීන් සංඛ්‍යාව ක්‍රමානුකූලව අඩුවීම සම්බන්ධයෙන් කළමනාකාරීත්වයේ අවධානය යොමු කර තීරණ ගත යුතුය. |
| (ආ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව, ආරෝග්‍යශාලා මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලය තුළ නොවූ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් නමින් තනතුරක් ඇතිකර එම තනතුර සඳහා නිලධාරිනියක පත්කර තිබුණි. නිශ්චිත කාර්ය පැවරීමක් සිදුකර නොතිබුණු අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත පමණක් මාසිකව රු.**30,000** ක දීමනාවක් හා රු.**5,000** ක ප්‍රවාහන දීමනාවක් ගෙවා තිබුණි. **2018** නොවැම්බර් **01** දින සිට සිට **2019** දෙසැම්බර් **31** දින දක්වා වූ කාල පරිච්ඡේදය වෙනුවෙන් ගෙවා තිබුණු මුළු මුදල රු.**442,000** ක් විය. තවද රෝහල් පරිශ්‍රයෙන් බැහැර ස්ථානයක මෙම නිලධාරිනියගේ කාර්යාලය පවත්වාගෙන යාම වෙනුවෙන් රු.**172,709** ක කාර්යාල උපකරණ ලබාදී තිබුණි. | ආරෝග්‍යශාලා මණ්ඩලය පනතේ බලතල ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලයට හිමි පාලන බලතල අනුව අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ගේ කාර්යභාරය ඉටු කිරීමට හා අදාළ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීමට සුදුසු අයෙකු **2018** ඔක්තෝබර් **03** දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පත්කර රු.**30,000** ක දීමනාවක් ගෙවීමට අනුමැතිය ලබාදී ඇති බව, කොළඹ නිදහස් මාවතේ පිහිටා ඇති සභාපතිතුමියගේ කාර්යාලයේ මෙම නිලධාරිනිය සේවයේ යෙදෙන අතර, කාර්යාල උපකරණ සභාපතිතුමියගේ අනුමැතිය මත සපයා ඇති බව. | රෝහල් කාර්ය මණ්ඩලය සඳහා නව තනතුරු ඇති කිරීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතුය. රෝහල වෙනුවෙන් අදාළ තනතුරෙහි කාර්යභාරය හඳුනාගෙන නිශ්චය කර තිබිය යුතු අතර, කාර්ය පැවරීමක් සිදුකර අධීක්ෂණ නිලධාරියෙකු යටතට පත්කළ යුතුය.<br><br>එසේ කටයුතු නොකළ පත් කිරීම් සඳහා රජයේ අරමුදලින් දීමනා ගෙවීම වහාම නතර කළ යුතු අතර ලබා දී ඇති උපකරණ යළි රෝහල වෙත පවරා ගත යුතුය. |